මගේ අංකය: ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු - 2026

**සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,**
**දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,**
**ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,**

**<u>උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ/ අධිකරණ වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරි, වැඩසටහන් සහකාර සහ ගිණුම් සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු - 2026</u>**

2025.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර හතරක් (04 ක්) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලුම උපලේඛනගත රජයේ නිලධාරීන් සහ සංවර්ධන නිලධාරී, වැඩසටහන් සහකාර, ගිණුම් සහකාර තනතුරුවල නිලධාරීන් 2026 වර්ෂය සඳහා වූ ස්ථානමාරු අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පල කර ඇති Specimen Form “A” **ඉංග්‍රීසි මාධ්‍යයෙන්** නිවැරදිව සම්පූර්ණ කර දී ඇති උපදෙස් අනුව පහත සඳහන් අදාළ විද්‍යුත් ලිපින වෙත **මෘදුපිටපත්** (Soft Copies) **<u>2025.08.26 දින හෝ ඊට පෙර</u>** ඊමේල් කර එවිය යුතු අතර දෘඩ පිටපත් (Hard Copies) **<u>2025.08.29 දින හෝ ඊට පෙර</u>** ඒ ඒ අධිකරණයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් එක් එක් සේවාවන් අනුව (අධිකරණ ලිපිකරු සේවාව/අධිකරණ ලඝු ලේඛක සේවාව.....ආදී) නිවැරදිව පුරවා එක් ආවරණ ලිපියක් මඟින් ආකෘතිපත්‍ර බහාලන කවරයේ ඉහල වම් කෙලවරෙහි “**<u>පිරිස් පාලන අංශය - වාර්ෂික ස්ථාන මාරු - 2026</u>**” වශයෙන් සඳහන් කර ‘ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ - 12’ යන ලිපිනයට එවිය යුතුය.

| අනු අංකය | තනතුර | ලිපි ගොනුව නම් කළ යුතු ආකාරය | එවිය යුතු විද්‍යුත් ලිපින |
|---|---|---|---|
| 1. | අධිකරණ රෙජිස්ට්‍රාර් | උදා:- Registrar – DC Colombo | regi.antr@jsc.gov.lk |
| 2. | අධිකරණ පවුල් උපදේශක | උදා:-FC – DC Colombo | fc.antr@jsc.gov.lk |
| 3. | සංවර්ධන නිලධාරී | උදා:-DO – DC Colombo | do.antr@jsc.gov.lk |
| 4. | අධිකරණ ලිපිකරු | උදා:-Clerk – DC Colombo | clerk.antr@jsc.gov.lk |
| 5. | අධිකරණ භාෂණ පරිවර්තක | උදා:-Interpreter – DC Colombo | inter.antr@jsc.gov.lk |
| 6. | අධිකරණ ලඝු ලේඛක | උදා:-Steno – DC Colombo | steno.antr@jsc.gov.lk |
| 7. | අධිකරණ යතුරු ලේඛක | උදා:-Typist – DC Colombo | typist.antr@jsc.gov.lk |
| 8. | අධිකරණ පොත් බැඳුම්කරු | උදා:-Book Binder – DC Colombo | binder.antr@jsc.gov.lk |

02. ඉහත පළමු වැනි ඡේදයේ සඳහන් පරිදි වර්ෂ හතරක් (04 ක්) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නමුත් ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරනු නොලබන නිලධාරීන් සේවා අවශ්‍යතා මත පුරප්පාඩු පවතින අධිකරණවලට අනිවාර්යයෙන්ම ස්ථාන මාරු කරන අතර, එවැනි නිලධාරීන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා නැවත සලකා නොබැලීමට ද අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

03. ස්ථානමාරු ඉල්ලා සිටීමේ දී නිලධාරීන් විසින් තම කැමැත්ත අනුව අනිවාර්යෙන්ම ස්ථාන පහක් (05 ක්) නම් කල යුතු අතර වර්තමාන සේවා ස්ථානය පිහිටි අධිකරණ සංකීර්ණයේ වෙනත් අධිකරණයන් ද නම් නොකළ යුතුය.

**<u>අයදුම් කලයුතු ආකාරය පිළිබඳ උදාහරණ</u> :-**

**<u>මාතර දිසා අධිකරණයේ සේවයේ නියුතු නිලධාරියකුගේ තේරීම්</u> :**

1. තංගල්ල අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
2. ගාල්ල අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
3. දෙයියන්දර මහේස්ත්‍රාත් අධිකරණය
4. වලස්මුල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
5. හම්බන්තොට අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්

**<u>තෙල්දෙණිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ සේවයේ නියුතු නිලධාරියකුගේ තේරීම්</u> :**

1. මහනුවර අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
2. ගම්පොල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
3. නාවලපිටිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
4. මාතලේ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
5. ගලගෙදර මහේස්ත්‍රාත් අධිකරණය

04. ඒ අනුව ඉහත 03හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් විෂයෙහි ද ඉහත 02හි සඳහන් පරිදි කටයුතු කරනු ලැබිය හැකි බව මෙයින් අවධාරණය කරනු ලැබේ.

05. මෙම ලිපියේ උපදෙස් ප්‍රකාරව ස්ථාන මාරු අයදුම් කිරීමට නිලධාරීන් වග බලා ගත යුතු අතර ඔවුන් විසින් ඉල්ලා සිටිනු ලබන සේවා ස්ථාන ලබාදීමට නොහැකි වන අවස්ථාවන්හි සේවා අවශ්‍යතාවය මත අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නියමිත සේවා ස්ථානයක් ලබා දෙනු ඇත.

තව ද අධිකරණ ලඝු ලේඛක හා අධිකරණ යතුරු ලේඛක තනතුරු ආශ්‍රිතව දකුණු පළාත තුළටත්, අධිකරණ ලිපිකරු හා අධිකරණ පොත් බැඳුම්කරු තනතුරු ආශ්‍රිතව රත්නපුර හා බදුල්ල දිස්ත්‍රික්ක තුළටත් අධික ස්ථාන මාරු ඉල්ලීම් ප්‍රමාණයක් පවතින බැවින් එම නිලධරයන්ගේ ඉල්ලීම් (බරපතල රෝගී තත්වයන් හා සුවිශේෂී හේතූන් මත කරනු ලබන) සලකා බැලීම සඳහා ඉහත සඳහන් තනතුරු වලට අදාළව දකුණු පළාත තුළත් රත්නපුර හා බදුල්ල දිස්ත්‍රික්ක තුළත් සේවයේ නියුතු නිලධාරීන්ට සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු ලබා දීමට සිදු විය හැක.

06. දැනට වෙනත් අධිකරණ වෙත තාවකාලිකව අනුයුක්ත කරනු ලැබ සිටින නිලධාරීන් **<u>ස්වකීය ස්ථිර සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් පමණක්</u>** ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

07. තම කලත්‍රයා හෝ ආසන්න ඥාතියෙක් දැනට අධිකරණවල සේවයේ නියුතුව හෝ නීතිඥ වෘත්තියේ යෙදී සිටී නම් එවැනි කිසිඳු නිලධාරියෙකු කලත්‍රයා හෝ ආසන්න ඥාතියා සේවය කරන අධිකරණයටම හෝ නීතිඥ වෘත්තියේ යෙදී සිටින අධිකරණයට ස්ථාන මාරුවීම් ඉල්ලා නොසිටිය යුතුය.

08. **<u>ස්ථාන මාරු ලබාදීමේ පිළිවෙල</u>**

වර්තමානයේ අධිකරණවල සේවයේ නියුතු උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ උග්‍ර හිඟය හේතුවෙන් මානව සම්පත් කළමනාකරණය කර ගැනීමේ දී මතුවන ගැටලු සහගත තත්ත්වය මඟහරවා ගනිමින් අධිකරණ කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමුඛතාවය ලබා දෙමින් හැකිතාක් දුරට නිලධාරීන්ගේ ඉල්ලීම් ද ඉටු කිරීමට හැකි වැඩ පිළිවෙලක් සලකා බලනු ලැබේ.

09. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් බාර ගනු නොලැබේ.

10. 2025.12.31 දිනට ඔබ අධිකරණයේ වසර 04ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ නාම ලේඛනයක් ද සේවා ගණ අනුව වෙන් කොට ස්ථාන මාරු අයදුම්පත් සමඟ එවන මෙන් වැඩිදුරටත් දන්වමි.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 අගෝස්තු මස 20 වෙනි දින,
කොළඹ -12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.